ඔබට කිසිදා
මේ හිස් බව
බාල්දියකට වතුර පුරවන්නාක් මෙන්
පරාජය කළ නොහැක.
නමුත් ඔබ එය අර්ථ දක්වනු ඇත.

අහස දෙස බලන්න
එය විහඟුන්ගෙන් හිස්ය
පොළොව දෙස බලන්න
එහි ගර්භය පණුවන්ගෙන් හිස්ය.

ඩා දිය පෙරා ගෙන
රේල් පාරේ ඇවිද යාමට පෙර
බෑගය කුණු බක්කියකට හිස්
කරන්න
යන්නේ කොතැනටද?
පැමිණි තැනටමය..
පැමිණියේ කොහි සිටද?
හිස් බව තුළිනි.

බියෙන් හැකිළී
අඳුරු මුල්ලක සැඟවුණ
ළමාවෙකු එළියට ඇද
නෑ සියන් මැද
උත්සවාකාරයෙන්
කෝටු මස් කරන්න.
ඔහුගේ ආත්මය
බියකරු පිල්ලියක් වී
ඔබගේ පූජාසනයන්
හිස්කර දමනු ඇත.

රුධිරය ඉවතට ඇද
හදවත හිස් කර දමන්න.
ඔබට සිය දිවි නසා ගනීමට
බල කෙරෙනු ඇත.

යටත්වීමට බල කෙරුණු
ගරිල්ලෙකුගේ දෑස
ඔහුගේ පතොරම් බෑගය
මෙන්ම හිස්ය.
ඔබ එයට අකැමැතිය.
නමුත් කිසිවක් නොකරනු ඇත.

අත්හැර දමනු
ලැබූ ප්‍රේමයේ මුඩු බිම්
ලාබෙට වෙන්දේසි කරනු ඇත.
එහෙත් ඔබගේ පසුම්බිය හිස්ය.
ලිපිගොනු තුළද
කොන්දේසි හැරෙන්නට
කිසිවක්ම නැත.

මහා සෙනඟක් මැද වුව
එකම එක මුහුණක් සඳහා
හිස් තැනක් තිබිය හැකිය.
එහෙත් කිසිවෙකුත්
එය නොදකිනු ඇත.

අතට අසුවන සෑම දෙයකින්ම
ඔබගේ නිවස පුරවන්න
හැර දැමූ කවුළුවකින්
එතුළ බලන විට
හිස් බව දකිනු ඇත.

මොළය මිරිකා
මතකයන් ගලා යාමට ඉඩ හරින්න
කිසිවෙකු ඈත බස් නැවතුමක
ඔබ එනතුරු බලා සිටින බව
සිහිපත් වනු ඇත.

තවත් එක වතාවක්
එම අංකයම අමතන්න.
ඔබ ඇමතූ දුරකතනයෙන්
ප්‍රතිචාරයක් නොමැති බව
කාරුණිකව පහදා දෙනු ඇත.

මේ හිස් බව සදාකාලිකය
අපරාජිතය.
බස් නැවතුමක රාත්‍රිය මෙනි..
ඔබ එහි පැමිණි විටෙකදී
නොහඳුනනමරණ දැන්වීමක් මත
පෝස්ටරයක් අලවන්න

මගේ මිනී පෙට්ටිය මතට
පස් වැටෙන බොල්හරැ
ඇසෙන තෙක්
මාද ඔබ තුල වූ බව
ඔබ වටහා නොගනු ඇත.

කවි දහසක්
ලියූ පසුව
තවත් එක් කවියක් ලියන්න
එහි ලියැවෙනු ඇත්තේ
මේ හිස් බව ගැනය.
කරුණාකර
එය අර්ථ දැක්වීමෙන්
වළකින්න.

## අම්මා

මව මිය ගොසින් තුන් මාසය ගත වූවා
මහ ගෙයි තිබූ කලඑළියත් නැති වූවා
පුරහඳ රාහු ගිල ගත් ලෙස අඳුරු වූවා
පාළුව නිහඬ නිසසල බව රජ වූවා

නැගෙන බිඳෙන සයුරේ රළ ගෙඩි විලසින්
අතීතයට මගෙ සිතුවිළි කිමිද ගොසින්
පාලු නිවසෙ දොර අහුමුළු කවුළු තුළින්
මවගේ රුව මැවී පෙනෙනවා නොමළ ලෙසින්

පෙර තිබූ ගෙදර අසිරිය අද මැකී ගොසින්
සුන්දර දැකුම්කලු දේ විපරීතව ගොසින්
පාළු සොහොන් පිටියක අද වෙස් ගනිමින්
ඔබ නැති නිසා මෙහි බලතල ගිලිහි ගොසින්

අම්මා කියා ගෙට ආ කල සෙනෙහෙ සිතින්
මා සිප වැළඳ ගෙන සුව දුක් විචාරමින්
කන්නට ආස දේ තෝරා බෙදා දෙමින්
දිව විමනක් කළා ගේ මට සහන දෙමින්

බුදු රුව ඉදිරියේ පහනත් නිවී ගොසින්
මුළුතැන් ගෙයි හැළි වළනුත් විවේකයෙන්
ලිප බුර බුරා නැගි ගිනිදැල් නිවී ගොසින්
නෙක නෙක රටා මවනවා මෙහි මකුළු සතුන්

ගෙමිදුල වටා තිබූ මල් ගොමු මිලින වෙමින්
රිසි සේ වැඩේ තණ බිස්සත් දණට උඩින්
හෙව් වැවී ගිය ගහ කොළ වදුල දෙමින්
මහ කළුවරක් ගෙන දෙනවා වටින් පිටින්

හැම බඩුවක්ම දූවිල්ලෙන් වැසී ගොසින්
අවපැහැයෙන් පෙනෙයි පිරිසිදු නොකිරීමෙන්
මැටි කළයේ දිය දෝතත් සිඳී ගොසින්
අම්මගෙ අඩුව වැටහෙනවා සතර දෙසින්

**සෙනෙහෙලතා රත්නායක**
ක්ලේටන්

## එක්ටැඹක චිත්‍රාව

හිස් අහස මුදුන් කොට
එක්ටැඹක උස්ව ගිය
දෙව් විමන් එකළු කල
උන්මාද චිත්‍රාව..

නෙත ගැටෙන මායිමක
සෙනෙහසක සිසිල් පොද
විඳගන්න තහනමක
හුදකලා හද මඬල..

ඉකිගසයි සෞම්‍ය වත
හිරුගින්න නෙත් හෙළන
සනසවයි අඳුරු ගැබ
සඳ ඔබේ සිසිල් බව..

පුන් පෝය දා අහසේ
චන්ද්‍රයා සේ කුසේ
හොවා උන් පුතණුවන්
සොයා යයි සිත මගේ..

ඔබෙ නමින් හෙළු කඳුළු
ණය ගෙවයි ඔබෙ පුතුන්
සනසන්න ළඟින් හිඳ
ඉකිගසන සිත මගේ ..

අළු යටින් මතු වෙචච
ගිනි පුළිඟුවක් වගේ
සිඳ සතුරු බල මුලින්
තෙද විකුම් පා තොසින්..

උරුමයක් සිහසුණේ
මතු දිනක සොයා එන
හිමි අපේ දෙනෙත වේ
පඬු අබා පුත නුඹෙ..

**පුෂ්පිකා ගමගේ**
රොක්ස්බර්ග් පාර්ක්

*අන්තර්ජාලයේ සාහිත්‍ය කවුළුව*
***www.ketapathpawra.com***

## දීග ගිය දුවේ

ලප නොමවන් සඳ මෙන් පිරි සොළොස් කලා
හස කැල්මෙන් මුළු ගේ ඔබ එකළු කළා
රන් කෙන්දෙන් බැඳ ඳෑඟිලි පැන් වඩලා
ගිය අන්දම් මනසේ තව නැත මැකිලා

එදවස පටන් කය මිස සිත නැති ලෙසක
මුළු වී හිඳිමු හිරු රැස් නොවැටෙන ලොවක
පසුගිය දවස නිල් මහනෙල් පිරි විලක
පිපේවිද කුමුදු යලි මෙහි අමාවක

පොත පත තීරු දිග හරිනා කෙනෙකු නැත
බෝනික්කන් කෙළි වලසුන් ගැටෙයි නෙත
සිනමා තාරකා වැජඹෙයි අරා බිත
ඔබ රැඳි කුටියෙ තවමත් ඔබෙ සුවඳ ඇත

ෂූබට් ෂූමාන් සමගින් බේතෝවන්
යලි පණ ලබා ඔබේ සියුමැලි ඇඟිලි තුඩින්
සත්සර මියුරු නාදය ගෙ පුරා රැව් දුන්
පියානෝ පියන එලෙසම වැසූ ගමන්

ඉදිකටුවේ නූල මෙන් ඔබ පසු පැමිණී
බලු සුරතලිය අකලට වැහැරුනා වැනී
උකටලි ලෙස වකුටුව දොර ලඟ ඉන්නී
දැන් දැන් ඔබ එතියි පෙර මග බලමින්නී

-ම-යනු -ල-යනු මල වැනි මා සිඟිති දුවේ
-අ-යනු -ල-යනු අල අමතක නොකළ දුවේ
නව ලොව ඔබේ මෙහි සිට දුර ඈත නොවේ
දිනකට හෝ සඳ පහනක් වෙයන් දුවේ

**මොරගොඩ මලියසේන**
කැන්බරා

## දාන පාරමී

බැලීම් නෙත් හැර
කිම ද කලබල
රිය ගැටුමකි මහා
විලකි රතු ලේ
සිහිය ගියෙ සිඳී..

බැලීම් නෙත් හැර
සිටිමි ඇඳ මත
දිටිමි රතු ලේ
සිරුර වෙත යන
ගියෙමි නිදි ලොව

බැලීම් නෙත් හැර
දිවි රැකී ඇත
සදා ණය වෙමි
දුනට ලේ දන්

සුව ලැබූ පසු
දෙන්ට ලේ දන්
කළෙමි අදිටන්
සැළකුමට
කලගුණ..

**ලක්ෂ්මී ගුණරත්න**

## අරවින්ද නම් ඔහු..

බතී.. මෙහෙ එන්න
බලන්න
පිටගම්කාරයෝ ඇවිත්
මහ ගෙදර
අද..
කෝ, කොහිද?
අරවින්ද...
ඔබ
කියා දුන්
'ඉංගමාර්'
කන්තෝරු කාමරේ
මේසෙ උඩ තාම
සොයමි මම...
කොහිද? අරවින්ද,
ඔබ..
'නියතයකි.. '
'නිමිත්තකි.. '
ඔබ...
කියවා අවසන් නොකල
පොතකින් ගිලිහුන
සොඳුරු කවියකි..

**රංජිත් ගමගේ**
රියාද් නගරය

## නොතිවූ තිත

ඔබ ගිය එක හොඳයි
අඩු ගානෙ නොතබා
නැවතිමෙ තිතක්වත්

මම ඉතින්
තබා එතනට
ලොකු කොමාවක්

මක මකා ලියමි
ලිය ලියා මකමි

ලැබෙන තුරු
තුටින් නිමවන
සුරඟන කතා
නිමාවක්

**සුසන්ත ජානක**

## හලෝ... හලෝ..



ග්‍රැහැම් බෙල් නිපදවා වැඩි දියුණු වූ පිනට
සෙලියුලර් මුළු ලොවේ ඇවිත් ඇති මුත් මුලට
ඇඟිලි පහ ඇතුළෙ සිර වෙලා ළං වී කනට
නුඹ තමයි වින කලේ අද පවුල් ගණනකට

වාහනේ එළවතත් එක් අතක් ඇත කනේ
අනතුරක් සිදු වුණත් රියදුරුට නොම දැනේ
සෙලියුලර් මිසක වෙන කවුද කලෙ මේ විනේ
දොස්තරට කැක්කුමද ලෙඩා ගේ ඇති වනේ

තනි තනිව වෙන් වෙලා කතා කරනා එකේ
බලා ඉන්නා අයට පුදුම වී එයි සැකේ
අවැසි දේ කියන මුත් දකින්නේම යවකේ
පණිවුඩය කෙටි වෙවී මොහොතකින් එය මැකේ

ගයාලා වයාලා නොතේරෙන අය කෙලින්
තරඟයෙන් දිනවන්නේ මේ සෙලියුලර් වලින්
සමනල්ලු වන බඹරු දුරස් වූවත් කලින්
උන්ට රොන් ගත හැකියි ඈත සුපිපුණු මලින්

දිවි ගෙවන දරු දැරියො දෙමව්පියො හත්තියේ
උඹ නිසා අද උන්ට විනෝදය අත් වියේ
එස් එ-මෙස් ගැසුව මිස වැඩ නොකල පන්තියේ
අසරණයි නේද උඹ අනේ පෙම් වන්තියේ

බස් එකේ දුම්රියේ රෝහලේ ලෙඩ අතර
විපිලිසර කෙනෙක් නැත සුදෝ සුදු නුඹ විතර
උඩඟුකම හිතට ගත් සමහරුන් කට හැකර
හඬ නගා කෑ ගසයි පෙරලෙන්ඩ ගිරි සිකර

හුදකලා වන අයට තනි නොතනි රැකෙන්නේ
ගවු ගණන් දුරක සිට අවැසියන් ගෙනෙන්නේ
රුවක් දක්නට නැතත් හඬින් රුව මැවෙන්නේ
දෙවියො දුන් දෙයක් යැයි සමහරුන් හිතන්නේ

මව්පියන් දුක් වෙවී සොයා දුන් සල්ලියේ
අගය දැන ගත යුතුය ගියත් නුඹ දිල්ලියේ
යට නොවී අදහසට අනිත් කොලු කල්ලියේ
බිම දමා පාගපන් අනේ බුදු මල්ලියේ

කන්ට බොන්නට නැතිව බඩේ බඩවැල් නැතත්
දිලින්දගෙ පවා ඇත ඉස්සිලා එක අතක්
පෙම් රසින් ඔකඳ වී ඇති නමුත් පිපි වතක්
අන්තිමේ නැති වේවි සිටි පරණ පෙම් වතත්

එන්ට කෙනෙකුට නොදී වසා ගෙන දොර පියන්
කොත් විලක්කුව තියන පෙට්ටගම උඩ තියන්
තනි තනිව කතාකොට පොතක් අරගෙන ලියන්
පිස්සු හැදිල ද නගේ සෙලියුලර් මට දියන්!

හිරිකුළුවේ, **මියුලා ආරියවතී**

## සිසිර කුණාටු



සිසිරයේ දඬුවමට යටත්කොට
නිරුවත් කළා වු ගහකොල
මුළු රැය පුරාවට වැගුරුවේ කඳුළු කැට
සිහිපත්ව උනුන් හැර ගිය වසන්තය.

රැය පුරා ගර්ජනා කරමින් හමාලූ
සැඬ සුළග දුන් අනිසි තාඩන පීඩන
දැක දුබල වු සෙයින් දොරට ආ ලාහිරු
සිපියි තුරුලතා හෙමිහිට

සානුකම්පාවකින්
මිදීගිය පිනිකඳුළු පිසමින්
විහිදනා ඒ දෑත
අහස දෙස ඔසවා
යදින්නේ දෙවියන්ද
උන් ඉල්ලමින් උනුන්ගේ අයිතිය.

කිමද මේ ප්‍රකෝපය?
සියල්ලෝ කීවෝය
ආනන්දජනක යයි වසන්තය
එහෙත් කිම කිසිවෙකුත් නොකීවේ
රැදෙන්නේ එය
නුඹ හා කෙටි කලක් පමනක් බව.

**චන්ද්‍රිකා ද සිල්වා**




සංස්කරණය
තුෂාරි ප්‍රියංගිකා

### බුදු රදුන් (නො)දෙසු අලුත්ම ගාථාව



හිරු රැස් යට සිට
ගිනි රැස් විහිදන
සඳ රැස් යට සිට
අඳුරට පොරකන
මනුසත සිටිනා
ලොව මැද
පින්වත ඔබ
දුටුවෙ කෙලෙස ද?
බුදු රැ ස් !

**ලක්ෂ්මන් කොඩිතුවක්කු**

සංවාද කවි:
## අදමිටු සංක්‍රමණිකයා

නොමිලේ උගත්කම සේව ලබා ගෙන
පිටු පා හෙමින් පිටරටකට බඩ ගාන
පිටරට සුව සැපත ගැන පාරම් බාන
අනුවණ කමකි නැතිනම් ගතියකි දීන

දුප්පත්කමට නැති බැරි කම් වලට බැඳී
සුන්දර හෙට දිනක් ගැන සිහිනයක වෙලී
ආවත් පිටරටක බැඳ ගෙන පැතුම් පොදී
ඉපදුන රටට ගරහන එක කමකි මිදී

මන්දිර යාන වාහන තිබනා යාලූ
මිය යන දාට ඔහු අර ගෙන යනවාලූ
සමහර අයට මුල අමතක වෙනවාලූ
තලු මර මරා පිහියෙන් කිරි කනවාලූ

අරක්කුවට දැන් ඔහු විස්කිලූ බොන්නේ
නිදහස් සටන ගැන අද ඔහු ගරහන්නේ
මැරුණට අනිත් අය මොකට ද දුක් වෙන්නේ
බත් කන කටින් ඔහු වෙන මොනවද කන්නේ

ළිඳෙන් වතුර බී මුහුදට ආ වඩාවී
සෙවණ දුන් ගසේ අතු සිඳ දමාවී
බවයක ඔසී රට ඔබ පැතු ලෙස පේවී
කැන්ගරුවෙක් වෙලාවත් ඔබ ඉපදේවී

**සරත් වීරසේකර** කැනඩාව



රහසේ මැදියමේ පිපෙනා
සේපාලිකා මල් සුවඳින්
පිරුණු...
හද පතුල කලඹමින් සොයන
මුතු කැටයක් මෙන්.......
හදවත පුරා
ලස්සනට සිතුවම් කළ
සොඳුරු සිත්තමක් මෙන්.....
ලස්සන තාරකා මැද බබලන
පුර හද මෙන්.
ජීවිතයට ආලෝකය නම් ඔබ
පමණමය......

**නිල්මිණී ප්‍රියදර්ශිකා**
ජර්මනිය

## අයියණ්ඩියේ

ඔබ මට නැති මේ සසරේ, උණුසුම වේවා
අයියේ ඔබ මිණි පහනක එළියක් වේවා
මගේ අයියා මතු සසරෙත් මගේම වේවා
උපදින හැම භවයකදිම මට හිමි වේවා

ඔබ මට කිසි විට කිසි වරදක් නොකියූවා
ඔබ මා හැර ගිය මොහොතේ කඳුළු පිරවූවා
මෙලොවින් ඔබ මා තනිකර එලොවට වූවා
අයියා මාගේ වෙන්න කියා සැමදා පැතුවා

**නිරෝෂා දමයන්ති**
(1996.06.26 *දින මියගිය සොහොයුරා වෙනුවෙනි*)